(නවවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 1(23).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 දෙසැම්බර් 15 බ්‍රහස්පතින්දා**

**2023 ජනවාරි 05 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3207/2022

ගරු මිලාන් ජයතිලක මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් සමාජ සවිබලගැන්වීමේ වැඩසටහනට දායක කර ගෙන ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමෘද්ධි සංවර්ධන අරමුදල් ආයෝජනය කර තිබේද;

(ii) එසේ නම්, එසේ ආයෝජනය කර ඇති ආයතනවල නම් කවරේද;

(iii) එම ආයෝජන වෙනුවෙන් ලැබූ ප්‍රතිලාභ ප්‍රතිශතාත්මකව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3217/2022

ගරු සුදත් මංජුල මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයේ පොදු කටයුතු වෙනුවෙන් භාවිතා කිරීම සඳහා ඉදිකිරීම් ආරම්භ කරන ලද, එහෙත් වැඩ අවසන් නොකළ ගොඩනැගිලි ශ්‍රී ලංකාවේ පවතින බව දන්නේද;

(ii) එම ගොඩනැගිලි සම්බන්ධයෙන් තොරතුරු එක්රැස් කර තිබේද;

(iii) එම ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3235/2022

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික පාසල් 1000ක් පිහිටුවීමේ වැඩසටහන සඳහා මේ වනවිට තෝරාගෙන ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් සංඛ්‍යාව, සිංහල, දෙමළ සහ මුස්ලිම් පාසල් ලෙස පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වැඩසටහන සඳහා පාසල් තෝරාගැනීමේදී ජන සංයුතිය සැලකිල්ලට ගෙන තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වැඩසටහන සම්බන්ධයෙන් අංක 3/2020 දරන චක්‍රලේඛය නිකුත් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම චක්‍රලේඛයේ විධිවිධාන අනුව ඉහත වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන්නේද;

(iii) ඉහත වැඩසටහන සඳහා පාසල් තේරීමේ බලය දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපතිවරුන්ට ලබා දී ඇති බව දන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3263/2022

ගරු මර්ජාන් ෆලීල් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ටින් මාළු අපනයනය කිරීමේ කර්මාන්ත බේරුවල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන බවත්;

(ii) මාළු සපයා ගැනීමේදී පවතින අපහසුතා හේතුවෙන් මේ වනවිට ඉහත කර්මාන්තකරුවන් දැඩි දුෂ්කරතාවයන්ට පත් වී ඇති බවත්;

(iii) ඉන්ධන මිල ඉහළ යාම සහ ඉන්ධන ලබා ගැනීමේදී පවතින දුෂ්කරතා හේතුවෙන් එම කර්මාන්තය බිඳ වැටී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ටින් මාළු අපනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා සහ කර්මාන්තකරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා ගනු ලබන පියවර වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3265/2022

ගරු දිලිප් වෙදආරච්චි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "ළඟම පාසල හොඳම පාසල" වැඩසටහන සඳහා වර්ෂ 2015 සිට 2019 දක්වා වෙන් කරන ලද මුදල;

(ii) ඉහත සඳහන් වැඩසටහන යටතේ සංවර්ධනය කරන ලද පාසල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වැඩසටහන යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ සංවර්ධනය කරන ලද ජාතික පාසල් සහ පළාත් සභා පාසල් සංඛ්‍යාව;

(ii) ඒ අතරින් වැඩ නිම කර ඇති සහ වැඩ නිම කර නොමැති පාසල් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3319/2022

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ආහාරයට ගනු ලබන බිත්තර වර්ග කවරේද;

(ii) ශ්‍රී ලංකාවට බිත්තර ආනයනය කරන්නේද;

(iii) එසේ නම්, එම බිත්තර වර්ග කවරේද;

(iv) බිත්තර ආනයනය කිරීම සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල කොපමණද;

(v) මේ වනවිට කුකුළු බිත්තරයක විකුණුම් මිල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ විවිධ මිල ගණන් යටතේ කුකුළු මස් අලෙවි කරනු ලබන බව දන්නේද;

(ii) එසේ නම්, කුකුළු මස් සඳහා පාලන මිලක් නියම කිරීමට පියවර ගෙන තිබේද;

(iii) එම පාලන මිල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3334/2022

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ළදරුවන් සහ ගර්භනී මව්වරුන් සඳහා පෝෂණ ආහාරයක් ලෙස ත්‍රිපෝෂ ලබා දීමේ වැඩසටහන ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) ත්‍රිපෝෂ පැකට්ටුවක අන්තර්ගත පෝෂණ සංයුතිය කවරේද;

(iii) ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනය විසින් වානිජ පරමාර්ථයෙන් යුතුව සුපෝෂ නමින් නිෂ්පාදනයක් වෙළඳපළට නිකුත් කරන්නේද;

(ii) එම නිෂ්පාදනයෙන් ඉහත ආයතනය උපයනු ලබන වාර්ෂික ආදායම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ වාර්තාවලට අනුව ළදරු මන්දපෝෂණයෙන් පෙළෙන රටවල් අතරින් ශ්‍රී ලංකාව ලබා ඇති ස්ථානය කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ ළදරු මන්දපෝෂණය ඉහළ අගයක් ගෙන තිබේ නම්, එයට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3371/2022

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පැවැති යුද්ධමය තත්ත්වය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත්වල ජීවත් වූ දමිළ ජනතාව දහස් ගණනක් ඉන්දියාවට සංක්‍රමණය වී එහි කඳවුරු තුළ හා පිටත රැඳී සිටින බවත්;

(ii) මේ වනවිට යුද්ධය තත්ත්වය අවසන් වී ඇතත්, ඉහත පිරිසෙන් ආසන්න වශයෙන් 100,000ක පමණ පිරිසක් නැවත ශ්‍රී ලංකාවට පැමිණීමට නොහැකිව සිටින බවත්;

(iii) ඉහත සඳහන් ජනතාව අතරින් කඳවුරුවලින් පිටත ස්ථානවල ජීවත්වන බොහෝ පිරිසකට ඉන්දීය රජය විසින් වීසා බලපත්‍ර ලබා නොදීම හේතුවෙන් ඔවුන් ශ්‍රී ලංකාවට නැවත පැමිණීමේදී ඉන්දියාවේ ජීවත් වූ මුළු කාලය සඳහාම වීසා බලපත්‍ර ගාස්තු ගෙවීමට සිදු වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) ඉහත සඳහන් ජනතාව නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3582/2022

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සයිප්‍රස් ජනරජයේ ස්ථාපිත කර තිබූ ශ්‍රී ලංකා කොන්සියුලර් ජනරල් කාර්යාලය වසා දමා තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා බලපාන ලද හේතු කවරේද;

(iii) එම කාර්යාලය වසා දැමීම හේතුවෙන් සයිප්‍රස් ජනරජයේ සේවය කරනු ලබන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ සුභසාධන කටයුතුවලට දැඩි ලෙස බාධා සිදු වී ඇති බව පිළිගන්නේද;

(iv) එසේ නම්, මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3853/2022

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කඳාන, (ආනියාකන්ද) ප්‍රාදේශීය රෝහල සතු ගොඩනැගිල්ලක් කඳාන හෙද විද්‍යාලයේ ඉගෙනුම ලබන හෙද ශිෂ්‍යාවන්ගේ අධ්‍යයන කටයුතු සඳහා ලබා දී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) හෙද ශිෂ්‍යාවන්ගේ අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම්, උතුරු කොළඹ ශික්ෂණ රෝහලෙහි සහ එම ප්‍රදේශයේ අනිකුත් රෝහල්වල පවතින බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, කඳාන (ආනියාකන්ද) ප්‍රාදේශීය රෝහලේ ඉහත සඳහන් ගොඩනැගිල්ල එම රෝහලට නැවත පවරා දීමට ගනු ලබන පියවර කවරේද;

(ii) උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ පවතින අධික තදබදයට විකල්ප විසඳුමක් ලෙස කඳාන (ආනියාකන්ද) ප්‍රාදේශීය රෝහල සංවර්ධනය කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ නියෝග,— 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 7(3), 8, 10, 11 හා 12 වගන්ති සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 27 වගන්තිය යටතේ සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2022 ඔක්තෝබර් 20 දිනැති අංක 2302/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.12.13 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග (අංක 1),— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 27(1) හා (5), 28(2) හා(3), 64(2) හා 70 වගන්ති සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය බල ප්‍රදේශයේ හා එහි සිට ව්‍යාපාර කටයුත්තක් සිදු කිරීමට බලයලත් තැනැත්තෙකු ලෙස සුදුසුකම් ලැබීම සම්බන්ධයෙන් කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවෙන් විමසා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 සැප්තැම්බර් 28 දිනැති අංක 2299/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.12.13 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග (අංක 2),— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 27(1), 41(3)(ඊ) හා 41(9) වගන්ති සමඟ කියවිය යුතු 71(1) වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවෙන් විමසා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 සැප්තැම්බර් 28 දිනැති අංක 2299/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.12.13 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 158 වගන්තියේ (2) සහ (3) උපවගන්ති සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජූලි 07 දිනැති අංක 2287/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.12.13 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2023 ජනවාරි 05 බ්‍රහස්පතින්දා)**

350/2022

ගරු හේෂා විතානගේ මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට මේ දක්වා මරණ දඬුවම නියම වූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පුද්ගලයාගේ නම, ලිපිනය, මරණ දඬුවම නියම කරන ලද අධිකරණය, නියම කරන ලද දිනය සහ මරණ දඬුවම ලබා දීමට හේතුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත පුද්ගලයන් අතරින් ජනාධිපති සමාව යටතේ නිදහස් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පුද්ගලයාගේ නම සහ නිදහස් කරන ලද දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 38/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා,— ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණ තත්ත්වය වැඩි වෙමින් පවතින්නේද යන්න සොයා බැලීමටත්, එසේ නම් ඒ සඳහා ගත යුතු කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන ක්‍රියාමාර්ග පිළිබඳව සොයා බැලීම සඳහාත්; හඳුනාගත් ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාවට නැංවීම පිළිබඳව අධීක්ෂණය කිරීම සඳහාත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) විසින් ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණ තත්ත්වය වැඩිවෙමින් පවතින බව දෙවැනි වරටත් දන්වා ඇති හෙයින්ද;

ශ්‍රී ලංකාවේ සැබෑ ළමා මන්දපෝෂණ තත්ත්වය සම්බන්ධව විවිධ වූ වෙනස් මත සහ සංඛ්‍යාලේඛන ඉදිරිපත් වන හෙයින්ද;

උග්‍ර මන්දපෝෂණ තත්ත්වයට පත්ව ඇති ළමුන්ගේ සංඛ්‍යාව ඉතා ඉහළ මට්ටමක පවතින බව බොහෝ ප්‍රදේශවලින් වාර්තා වන හෙයින්ද;

දීර්ඝ කාලීන මන්දපෝෂණ තත්ත්වයක් පැවතීම හේතුවෙන් අනාගත දරු පරපුරේ සෞඛ්‍යය, අධ්‍යාපනය සහ සමාජ සංවර්ධනයට බරපතල බලපෑම් ඇති කළ හැකි හෙයින්ද;

ඉදිරි කාලය තුළදී තවත් ළමයින් ලක්ෂ 22 ක් මන්දපෝෂණ තත්ත්වයට පත්වීමට ඉඩ පවතින බවට වාර්තා පළවී ඇති හෙයින්ද,

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) විසින් නිකුත් කර ඇති වාර්තාවේ ඇතුළත් තොරතුරු පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතු හෙයින්ද;

ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණ තත්ත්වය වැඩි වෙමින් පවතින්නේද යන්න සොයා බැලීමටත්, එසේ නම් ඒ සඳහා ගත යුතු කෙටිකාලින, මධ්‍යකාලීන හා දිගුකාලීන ක්‍රියාමාර්ග පිළිබඳව සොයා බැලීම සඳහාත්, හඳුනාගත් ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාවට නැංවීම පිළිබඳව අධීක්ෂණය කිරීම සඳහාත් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරනු ලැබිය යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) එහි සභාපතිවරයා සහ සභික මන්ත්‍රීවරයන් කථානායකවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධානවල කුමක් සඳහන් වුව ද කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් විසි එක් දෙනෙකුට (21) නොවැඩි විය යුතු ය.

3. එම කාරක සභාවට —

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද;

බලය තිබිය යුතු ය.

4. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස හයක (06) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළත දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.